# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 75 — 1973 අගෝස්තු 31 වැනි සිකුරාදා — 1973.08.31**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... | අතිරේක | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ දැන්වීම් ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 153 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | 154 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 156 |


**සැ. යු.**—(i) මහනුවර තරුණ බෞද්ධ සමිති පනත් කෙටුම්පත 1973 අගෝස්තු 24 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ vi වැනි කොටසේ ඡූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛන යක් ද පළවේ.

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### දකුණු පළාත

**ගාල්ලේ දිස්ත්‍රික් උසාවි නඩු ශාලාවේදීය**

ගාල්ලේ, මාතර පාරේ අංක 34 හි, පකුර්දීන් මොහමඩ් අලි පවේල් ............................................................ පැමිණිලිකාරයා.

නොම්මරය : ඇම්. 3780 එදිරිව

ගාල්ලේ, කටුගොඩ, මුස්ලිම් පල්ලිය පාරේ අංක 10 නිවැසි අබ්දුල් හමීඩ් මොහමඩ් අන්වර් සහ තවත් අය ............... ............................................................ විත්තිකාරයෝ.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයනට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1973 ක්වූ ඔක්තෝබර් මස 03 දින පෙරවරු 10 ට පටන්ගෙන දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

රුපියල් 94,500 ක් සහ ඇස්කීසි ගාස්තු රු. 424.70 ක් අය කර ගැනීම සඳහාය.

උපලේඛනය

1. දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ කඩවත් සතර තුළ ගාලු පියද්දේ නුගදූවේ පිහිටි ගල්තොල්ලේවත්ත නොහොත් පින්වත්තේ අංක 'ඒ' දරණ කැබැල්ල, මායිම් :—උතුරට : මහවත්ත නොහොත් පන්සකාරගෙවත්ත නම් අංක බී. දරණ කැබැල්ල ; නැගෙනහිරට : ගම්සභා පාර (කලින් මහවත්ත නොහොත් පන්සකාරගෙවත්ත නොහොත් මෙම ඉඩම් ඉතිරි දෙකෙන් පංගු කැබැල්ල ; දකුණට : ගාල්ලේ සිට අකුරැස්සට යන මහපාර සහ බස්නාහිරට : ගල්තොල්ලෙගෙවත්ත නොහොත් පින්වත්ත යන මායිම් තුළ පර්චස් 39 ක් බිම් තරම ඇති වී. ඇල්. ඩී. අබේගුණවර්ධන මිනින්දෝරු මහතා විසින් සාදන ලද අංක 3170 දරණ ප්ලෑනයේ සඳහන් ඉඩමේ බිම සහ ඊට අයත් සියලු දේ වෙත්. මෙකී ඉඩම ගාල්ලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ. 224/176 හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී නුගදූවේ පිහිටි මහවත්ත නොහොත් පන්සකාරගෙවත්තේ බස්නාහිර දෙකෙන් පංගු කැබැල්ලේ බස්නාහිර කැබැල්ල සහ ඊට යාවූ ඕවිට යන අංක 'බී' අක්ෂරය දරණ ඉඩම් කැබැල්ල, මායිම් :—උතුරට : ලුනුවිල ; නැගෙනහිරට : අලුත් ගම්සභා පාර (කලින් මහවත්ත නොහොත් පන්සකාර නොහොත් පන්සකාරගෙවත්ත නොහොත් මෙම ඉඩමේ අනිත් දෙකෙන් පංගු කැබැල්ල ; දකුණට : ගල්තොල්ලෙවත්ත නොහොත් පින්වත්තද ; උතුරට : 'ඒ' අක්ෂරය නමින් හඳුන්වනු ලබන මහපාරද සහ බස්නාහිර සත්තම්බිගෙවත්ත යන මායිම් තුළ ඉහත කී ප්ලෑන අංක 3,170 දරණ සේ පාරද, අ. 2, රූ. 3, පර්. 21.5 ක් පමණ බිම් තරම ඇති ඉඩමේ බිම සහිත සියලු දේ වෙත්. මෙය ගාල්ලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ. 224/117 හි ලියාපදිංචි කර ඇත.

3. ඉහත කී නුගදූවේ පිහිටි මහවත්ත නොහොත් පන්සකාරගෙවත්තේ අංක 3 දරණ ඉඩම් කැබැල්ලට මායිම් :—උතුරට : ලුනුවිල ; නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 4 දරණ කැබැල්ලද ; දකුණට : මොරවක්කෝරලේට යන පාරද ; බස්නාහිරට : අලුත් ගම්සභා පාර,

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළු දෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1972 ජනවාරි මස 7 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

---

6 දක්වා වූ බාලවයස්කාරයන් වගලත් තරකරුවන් වෙනුවෙන් භාරකාරයා ලෙස ඉහත කී 7 වෙනි වගලත් තරකරු පත් කරන ලෙසද මෙයින් අණ කරනු ලැබේ.

ඩබ්ලිව්. පී. එන්. ද සිල්වා,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

විරුද්ධවාදිකම් ඉදිරිපත් කිරීමේ දිනය 1973 ජූලි මස 26 දින දක්වා දීර්ඝ කරණ ලදී.

ඩබ්ලිව්. පී. එන්. ද සිල්වා,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

1973. 6. 14 දින.

විරුද්ධවාදිකම් ඉදිරිපත් කිරීමේ දිනය 1973 සැප්තැම්බර් මස 13 දින දක්වා දීර්ඝ කරණ ලදී.

ඩබ්ලිව්. පී. එන්. ද සිල්වා,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

1973.7.26.

8-1209—73. 08. 31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

**දෙව් සුව සේවාව යනුවෙන් සමිතියක් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

ජේ. පී. ඔබේසේකර වන මම, ශ්‍රී ලංකාවේ ජාතික රාජ්‍ය සභාවේ 52 වන ස්ථාවර නියෝගය යටතේ, "දෙව් සුව සේවාව යනුවෙන් සමිතියක් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් ජාතික රාජ්‍ය සභාවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පරමාර්ථ ඇති සමිතිය සංස්ථාගත කිරීමයි.

(අ) පහත සඳහන් කරුණු, එනම්—

(i) ශාරීරික, මානසික සහ ආත්මික වශයෙන් රෝගාතුර තැනැත්තන් බලාකියා ගැනීම, ඔවුන්ට සහනය සැලසීම සහ ඔවුන් සුවපත් කිරීම; සහ

(ii) මාදක ධූර්තයන් හා සුරාසොඬුන් එසේ ධූර්ත වීමෙන් හා සුරාසොඬ වීමෙන් මුදවා ගැනීම

යන කරුණු සඳහා සුවපත් කිරීමේ පුණ්‍ය නිවාසයක් පිහිටුවීම; සහ

(ආ) වෛද්‍ය, මනෝවිද්‍යාත්මක සහ ආධ්‍යාත්මික ක්‍රම සහ උපක්‍රම භාවිත කරමින් එනම්, වෛද්‍යවරුන්ගේ, මනෝවිද්‍යාත්ඥයින්ගේ, පූජකවරුන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ සේවය ලබා දීමෙන් සහ ශරීරය, මනස සහ ආත්මය සුවපත් කිරීමෙහි ලා එකිනෙකාගේ දක්ෂතා පරිපූරණය කරන කණ්ඩායමක් වශයෙන් එක්ව වැඩ කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් මිනිසා යළිත් පරිපූර්ණත්වයට පත් කිරීමට උපකාර වීමද වේ.

ජේ. පී. ඔබේසේකර,
මීරිගම මහජන මන්ත්‍රී.

8-1231—73. 08. 31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී, සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.27 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.03 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.10 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.17 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.24 | සිකුරාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.